# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2199/7 - 2020 ඔක්තෝබර් මස 26 වැනි සඳුදා - 2020.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ (2) වගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීම හේතු කොට ගෙන ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 ආ (2) වන වගන්තිය යටතේ තනතුර දැරූ සභාපති වන උඩුකුඹුරගේ සුමිත් වීරසිංහ අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30)ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වණිකුලසූරියලාගේ අජිත් කුමාර් වික්‍රමසිංහ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, ගමලත්ගේ දිලීප් නිශාන්ත වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66 ආ (2) වන වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, වණිකුලසූරියලාගේ අජිත් කුමාර් වික්‍රමසිංහ, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ගමලත්ගේ දිලීප් නිශාන්ත,
තේරීම්භාර නිලධාරී,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

1A - G 33196 — 40 (2020/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ (2) වගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

උප සභාපති, සභාපති ධුරයට පත්වීම හේතු කොට ගෙන ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 ආ (2) වන වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන වර්ණකුලසූරියලාගේ අජිත් කුමාර් වික්‍රමසිංහ අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30)ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ උප සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අලවත්තගේ ධර්මකීර්ති නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, ගමලත්ගේ දිලිප් නිශාන්ත වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66 ආ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් අලවත්තගේ ධර්මකීර්ති, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**ගමලත්ගේ දිලිප් නිශාන්ත,**
තේරීම්භාර නිලධාරි,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.